# ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ඇති මහජන දැනුවත්භාවය පිළිබඳව පවත්වනු ලබන දීපව්‍යාප්ත සමීක්ෂණය පිළිබඳ නිවේදනය

ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පතු රක්ෂණ සහ නිරාකරණ දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳව මහජනතාව තුළ ඇති දැනුවත්භාවයේ මට්ටම තක්සේරු කිරීම සඳහා දීපව්‍යාප්ත සමීක්ෂණයක් ආරම්භ කරන බව ශ්‍රී ලංකා මහ බැංකුව මෙමගින් නිවේදනය කරනු ලබයි. මෙය, ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් අරමුදල් සපයනු ලබන මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියෙහි අංගයකි.

මෙම සමීක්ෂණය, ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන්, බාහිර ආයතනයක් වන කැන්ටාර් ලංකා (පුද්ගලික) ආයතනය (Kantar Lanka (Pvt.) Ltd) විසින් ක්ෂේත්‍ර සමීක්ෂකවරුන් යොදා ගනිමින් සිදු කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2025 සැප්තැම්බර් සිට 2025 නොවැම්බර් දක්වා කාලය තුළදී මෙම සමීක්ෂණය සිදු කිරීමට සැලසුම් කර ඇති අතර එමගින් ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් සමීක්ෂණයට භාජනය කිරීමට අපේක්ෂා කරනු ලබයි.

රැස්කර ගන්නා තොරතුරු මෙම සමීක්ෂණයේ අරමුණ සඳහා පමණක් භාවිතා කරන බවටත්, එම තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කරන බවටත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහතික වේ. එබැවින්, සමීක්ෂණ ප්‍රශ්නාවලියට පිළිතුරු සැපයීම සඳහා ඔබගේ සහයෝගය අප විසින් කාරුණිකව ඉල්ලා සිටින අතර ජාතික වැදගත්කමක් ඇති මෙම කර්තව්‍යයට ඔබ විසින් ලබා දෙන වටිනා දායකත්වය අපි අගය කරන්නෙමු.

මෙම සමීක්ෂණය සම්බන්ධයෙන් ඔබට කිසියම් ප්‍රශ්නයක්, සැකයක් හෝ පැමිණිලි තිබේ නම්, කරුණාකර පහත සඳහන් දුරකථන අංකය හෝ විද්‍යුත් තැපැල් ලිපිනයෙන් අප හා සම්බන්ධ වන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

දුරකථන අංකය: 1935

විද්‍යුත් තැපැල් ලිපිනය: fssnpcomplain@cbsl.lk

**අධ්‍යක්ෂ**
**තැන්පතු රක්ෂණ සහ නිරාකරණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**